# ණය මූල්‍ය සේවාවන්

## කල්බදු සහ පහසු කල්බදු (ලීසිං සහ Easy ලීසිං)

**ප්‍රධාන ලක්ෂණ**

- නව, භාවිතා කළ සහ පෙර හිමිකාරීත්වය දැරූ වාහන; යන්ත්‍රෝපකරණ සහ උපකරණ
- මහ බැංකුවේ වටිනාකම අනුව ණය (LTV) මාර්ගෝපදේශ අනුව මූල්‍යකරණය
- යූබී ෆිනෑන්ස් හිමිකාරීත්වය රඳවා ගන්නා අතර පරම අයිතිකරු සේවාදායකයා ලියාපදිංචි හිමිකරු වේ
- කල්බදු (ලීසිං) : ආපසු ගෙවීම අවුරුදු 7 දක්වා, සමාන හෝ ව්‍යුහගත බදු කුලී
- පහසු කල්බදු: අවුරුදු 3 දක්වා, ව්‍යුහගත බදු කුලී

**ගාස්තු**

- වෙළෙඳපොළ පදනම් පොලී අනුපාතය (වත්කම් හා වගකීම් කමිටුව (ALCO) තීරණය කරන)
- මෝටර් රථ දෙපාර්තමේන්තුවේ මාරු කිරීම් සහ සැකසුම් ගාස්තු
- රජයේ බදු සහ මුද්දර ගාස්තු

## වාහන ණය

**ප්‍රධාන ලක්ෂණ**

- වාහනයක් ඇපයට තබා ලබා දෙන ණය
- උපරිම කාලසීමාව: වසර 7කි
- කාරක ප්‍රාග්ධනය, වාහනයක් මිලදී ගැනීම හෝ පුද්ගලික/ව්‍යාපාරික අවශ්‍යතා සඳහා සුදුසු වේ

**ගාස්තු**

- වෙළෙඳපොළ පදනම් පොලී අනුපාතය (වත්කම් හා වගකීම් කමිටුව (ALCO) තීරණය කරන)
- වෙළෙඳපොළ අනුපාත අනුව පොලී අනුපාතය උච්චාවචනය විය හැක
- මෝටර් රථ දෙපාර්තමේන්තුවේ මාරු කිරීම් සහ සැකසුම් ගාස්තු
- බදු සහ නියාමන ගාස්තු

## පහසු ණය (Easy Loan)

**ප්‍රධාන ලක්ෂණ**

- වාහනයට අනුව ඇපවීම
- නම්‍යශීලී ආපසු ගෙවීමේ ක්‍රම
- පුද්ගලයින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආයතන සඳහා සුදුසු වේ

**ගාස්තු**

- වෙළෙඳපොළ පදනම් පොලී අනුපාතය (වත්කම් හා වගකීම් කමිටුව (ALCO) තීරණය කරන)
- වෙළෙඳපොළ අනුපාත අනුව පොලී අනුපාතය උච්චාවචනය විය හැක
- මෝටර් රථ දෙපාර්තමේන්තුවේ මාරු කිරීම් සහ සැකසුම් ගාස්තු
- බදු සහ නියාමන ගාස්තු

## පහසු ණයවර (Easy Draft)

**ප්‍රධාන ලක්ෂණ**

- වාහන, දේපළ, ස්ථාවර තැන්පතු සහ ඇපකර අනුව ලබා ගත හැකිය
- කාරක ප්‍රාග්ධනය, වාහන මිලදී ගැනීම හෝ පුද්ගලික/ව්‍යාපාරික අවශ්‍යතා සඳහා සුදුසු වේ
- මාසික ගෙවීම් ණය කාලසීමාව තුළ පමණක් පොලිය ආවරණය කරයි
- කලින් හෝ අර්ධ ප්‍රාග්ධන පියවීමට අවසර ඇත (නාමික ගාස්තුව අදාළ වේ)
- නම්‍යශීලී ආපසු ගෙවීමේ ක්‍රම

**ගාස්තු**

- වෙළෙඳපොළ පදනම් පොලී අනුපාතය (වත්කම් හා වගකීම් කමිටුව (ALCO) තීරණය කරන)
- වෙළෙඳපොළ අනුපාත අනුව පොලී අනුපාතය උච්චාවචනය විය හැක
- කලින් පියවීම් සඳහා බැඳීම් ගාස්තුව
- මෝටර් රථ දෙපාර්තමේන්තුවේ මාරු කිරීම් සහ සැකසුම් ගාස්තු
- බදු සහ නියාමන ගාස්තු

## උකස් ණය

| ප්‍රධාන ලක්ෂණ | ගාස්තු |
| --- | --- |
| • නිශ්චල දේපල උකසක් මගින් ඇපවීම<br>• උපරිම කාල සීමාව: අවුරුදු 10කි<br>• යූබී ෆිනෑන්ස් අනුමත වෘත්තිකයන් විසින් නීත්‍යානුකූලව සත්‍යාපනය කරන ලද දේපල | • වත්කම් හා වගකීම් කමිටුව (ALCO) තීරණය කරන ලද පොලී අනුපාතිකය<br>• නීතිමය සහ පරිපාලන ගාස්තු<br>• නිල ගාස්තුවට අනුව සැකසුම් සහ වෙනත් ගාස්තු<br>**අමතර ලියවිලි**<br>• හිමිකම් ඔප්පුව සහ පිඹුර<br>• උකස් ආරක්ෂණ ආවරණය |

## පුද්ගලික ණය

| ප්‍රධාන ලක්ෂණ | ගාස්තු |
| --- | --- |
| • පුද්ගලයින්ට සහ ආයතනික සේවාදායකයින්ට ලබා ගත හැකිය<br>• නම්‍යශීලී ආපසු ගෙවීමේ ක්‍රම<br>• ඇපකරුවන් අනිවාර්ය වේ | • වෙළෙඳපොළ පදනම් පොලී අනුපාතය (වත්කම් හා වගකීම් කමිටුව (ALCO) තීරණය කරන)<br>• වෙළෙඳපොළ අනුපාත අනුව පොලී අනුපාතය උච්චාවචනය විය හැක<br>• මෝටර් රථ දෙපාර්තමේන්තුවේ මාරු කිරීම් සහ සැකසුම් ගාස්තු<br>• බදු සහ නියාමන ගාස්තු |

## රන් ණය

| ප්‍රධාන ලක්ෂණ | ගාස්තු |
| --- | --- |
| • ඇපයට තැබූ රන් භාණ්ඩ අනුව ඇපවීම<br>• අවම ණය මුදල: රු. 5,000; උපරිමය අනුමැතිය පරිදි වේ<br>• තනි අයදුම්කරුවන් පමණි (හවුල් ණය නොමැත)<br>• සරල, අවම ලියකියවිලි | • වත්කම් හා වගකීම් කමිටුව (ALCO) විසින් - නියම කළ පොලී අනුපාතය<br>• උප නිෂ්පාදනයට අනුව සේවා ගාස්තු<br>• රජයේ බදු සහ ව්‍යවස්ථාපිත ගාස්තු<br>**වැදගත් සටහන්**<br>• මුදවා නොගත් රත්‍රන් නියමිත දැනුම්දීමෙන් පසු වෙන්දේසි කළ හැක<br>• නැතිවූ ටිකට්පත් වහාම වාර්තා කළ යුතුය |

## ස්ථාවර තැන්පතු පදනම් ණය

| ප්‍රධාන ලක්ෂණ | ගාස්තු |
| --- | --- |
| • ඔබගේ යූබී ෆිනෑන්ස් ස්ථාවර තැන්පතුව අනුව ඇපවීම<br>• ඔබගේ ස්ථාවර තැන්පතු වටිනාකමෙන් 75%ක් දක්වා ණයට ගත හැක<br>• අවම ලියකියවිලි අවශ්‍ය වේ | • පොලිය:ස්ථාවර තැන්පතු අනුපාතය + 4.0%<br>• අදාළ සැකසුම් ගාස්තු<br>**ආපසු ගෙවීමේ විකල්ප**<br>• මාසික පොලිය; කල්පිරීමේදී ප්‍රාග්ධනය<br>• කල්පිරීමේදී ප්‍රාග්ධනය සහ පොලිය<br>• සමාන මාසික වාරික |

# අයදුම් කරන ආකාරය

| | |
|---|---|
| **1. ශාඛාවක් වෙත ගමන් කිරීම** | යූබී ෆිනෑන්ස් ශාඛාවත් වෙත යන්න. ශබා පිහිටීම් ubf.lk හි ලැයිස්තු ගත කර ඇත./අපව අමතන්න. |

| | |
|---|---|
| **2. අයදුම්පත ඉදිරිපත් කිරීම** | අයදුම්පත සහ KYC ආකෘතිය සම්පූර්ණ කර, අවශ්‍ය සියලුම සහය ලියවිලි ඉදිරිපත් කරන්න. |

| | |
|---|---|
| **3. ණය ඇගයීම** | අපගේ කණ්ඩායම ඔබගේ ලියවිලි සත්‍යාපනය (පරිශීලනය) කර ණය සහ වත්කම් පරීක්ෂණයක් පවත්වනු ලබයි. |

| | |
|---|---|
| **4. අනුමැතිය** | බොහෝ පහසුකම් වැඩකරන දින 3ක් ඇතුළත අනුමත කෙරේ. තීරණය ඔබට දැනුම් දෙනු ලැබේ. |

| | |
|---|---|
| **5. ගිවිසුම් අත්සන් කිරීම** | අදාල ණය පහසුකමේ ගිවිසුම සහ ඇප බැඳුම්කරය අත්සන් කරන්න. වත්කමේ හිමිකාරිත්වය නිෂ්පාදන අයිතම අනුව මාරු කරනු ලැබේ. |

| | |
|---|---|
| **6. ණය ලබාදීම** | අරමුදල් ඔබට හෝ සැපයුම්කරු වෙත මුදා හරිනු ලැබේ. ඔබ විධිමත් කුලී ගෙවීම් සිදු කිරීම ආරම්භ කරන්න. |

# අවශ්‍ය ලියවිලි

| තනි පුද්ගල | තනි හිමිකරු | හවුල්කාරිත්වය | ආයතනික සේවාදායක |
|---|---|---|---|
| • ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය / විදේශ ගමන් බලපත්‍රය<br>• ලිපිනය සනාථ කිරීම (ජාතික හැඳුනුම්පත / උපයෝගිතා බිල්පත / ග්‍රාම සේවක සහතිකය)<br>• ආදායම් සනාථ කිරීම (වැටුප් පත්‍රිකා / බැංකු ප්‍රකාශන)<br>• ඇපකරු: හැඳුනුම්පත, | • ව්‍යාපාර ලියාපදිංචිය (BR)<br>• බැංකු ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන<br>• ඇපකරු: හැඳුනුම්පත, ලිපිනය සහ ආදායම් සනාථ කිරීම<br>• සේවාදායකයා සහ ඇපකරුවන් සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ | • ව්‍යාපාර ලියාපදිංචිය (BR)<br>• සියලුම හවුල්කරුවන්ගේ කැමැත්ත<br>• බැංකු ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන<br>• ඇපකරු: හැඳුනුම්පත, ලිපිනය සහ ආදායම් සනාථ කිරීම<br>• සේවාදායකයා සහ ඇපකරුවන් සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ | • BR / 41 ආකෘතිය හෝ 1/20 ආකෘතිය<br>• සංදේශය සහ සාංගමික ව්‍යවස්ථාවලිය (සහතික කළ)<br>• අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව (අධ්‍යක්ෂ/ලේකම් සහතික කළ)<br>• 13 ආකෘතිය (ලිපින සනාථ කිරීම)<br>• මූල්‍ය සහ බැංකු ප්‍රකාශන<br>• අධ්‍යක්ෂවරුන්ගේ/ඇපකරුවන්ගේ හැඳුනුම්පත, ලිපින සනාථ කිරීම, අයදුම්පත්‍ර සහ KYC ආකෘති පත්‍ර |

| | | | |
|---|---|---|---|
| ලිපිනය සහ ආදායම් සනාථ කිරීම<br>• සේවාදායකයා සහ ඇපකරුවන් සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ KYC ආකෘති පත්‍ර | KYC ආකෘති පත්‍ර | KYC ආකෘති පත්‍ර | |

### වාහන පහසුකම්

- සැපයුම්කරුගේ ඉන්වොයිසිය
- දෙවැනි යතුර
- ආදායම් බලපත්‍රය සහ බදු රිසිට්පත්
- වාහන තක්සේරු වාර්තාව
- ලියාපදිංචි සහතිකය (CR)

### ස්ථාවර තැන්පතු අනුව ණය

- මුල් ස්ථාවර තැන්පත් සහතිකය

### දේපල අනුව ණය

- හිමිකම් ඔප්පු
- පළාත් පාලන අධිකාරියෙන් (මහ නගර සභාව/ නගර සභාව/පළාත් සභාව) අනුමැතිය සහිත සැලසුම්
- අවුරුදු 35ක් සඳහා ඉඩම් ලියාපදිංචි කිරීමේ උධෘතය
- පළාත් පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද වරිපනම් බදු දැන්වීම
- ගොඩනැගිලි සැලැස්ම (ගොඩනැගිල්ලක් ඇත්නම්)
- අනුකූලතා සහතිකය
- පළාත් පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද හිමිකාරිත්ව සහතිකය
- වීදි රේඛා/ ගොඩනැගිලි රේඛා සහතිකය
- පවරා නොගැනීමේ සහතිකය

# පොදු තොරතුරු

- පහසුකම අනුමැතිය සඳහා ගතවන කාලය අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීම සහ ණය ඇගයීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම මත රඳා පවතී
- ශ්‍රී ලංකාවේ සංස්ථාපිත ව්‍යාපාර සහ වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික පුද්ගලයින් අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි
- වත්කම යූබී ෆිනෑන්ස් හරහා සම්පූර්ණයෙන් රක්ෂණය කළ යුතුය
- යූබී ෆිනෑන්ස් ඇපකරුවන් ඉල්ලා සිටිය හැකිය
- යූබී ෆිනෑන්ස් හි බලයලත් තක්සේරුකරුගෙන් ලබා ගත යුතු ඇපය පිළිබඳ නවතම තක්සේරුව
- ලබාගත් පහසුකම ගෙවීම් වාර්තා සමඟ ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කරනු ලැබේ
- විකල්ප ගෙවීම් ක්‍රමයක් ලබා දී ඇත්නම්, බැංකු දිනයට එක් දිනකට පෙර චෙක්පත් ගෙවීම් නැවැත්වීම පිළිබඳ දැනුම්දීම අවසර දෙනු ලැබේ.

## අනවසර හෝ වැරදි ගනුදෙනුව

සෑම අනවසර හෝ වැරදි ගනුදෙනුවක් පිළිබඳව ගනුදෙනුකරු වහාම යුබී ෆිනෑන්ස් වෙත දැනුම් දිය යුතුය. අදාළ නීති සහ ක්‍රියාපටිපාටිවලට අනුකූලව, සමාගමට විමර්ශනය කර සුදුසු ක්‍රියාමාර්ග ගත හැකිය. යම් මුදල් ආපසු ගෙවීමක් හෝ ආපසු හැරවීමක් එවැනි විමර්ශනයක ප්‍රතිඵලයට යටත් වේ.

## 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකිරීමේ පනත

යම් ගනුදෙනුවක් හෝ උත්සාහකළ ගනුදෙනුවක් යම් නීති විරෝධී ක්‍රියාවකට හෝ යම් සාපරාධි වරදක සමඟ සම්බන්ධතාවක් ඇති බව සැක කිරීමට යුබී ෆිනෑන්ස් වෙත සාධාරණ හේතු ඇති අවස්ථාවක, යුබී ෆිනෑන්ස් විසින් එවැනි ගනුදෙනු 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 7 වගන්තියේ විධිවිධාන යටතේ මූල්‍ය තොරතුරු ඒකකය වෙත වාර්තා කරනු ලැබේ.

## ණය පහසුකම් අයකිරීමේ ක්‍රියාපටිපාටිය

ගනුදෙනුකරුවන් විසින් ණය පහසුකම් ආපසු ගෙවීමට ඉඩසැලසීම සඳහා යුබී ෆිනෑන්ස් විසින් සෑම උත්සාහයක්ම ගනු ඇත. මෙවැනි උත්සාහයන්ට සිද්ධියෙන් සිද්ධිය මත පදනම් වී සමාගමේ සමස්ත ණයදීමේ ප්‍රතිපත්තිය තුළ ගනුදෙනුකරුවාගේ මුදල් ප්‍රවාහයන්ට ගැලපීම සඳහා නැවත උපලේඛනගත කිරීම සහ ප්‍රති-ව්‍යුහගතකිරීම ඇතුළත් වේ. ගනුදෙනුකරුවන් තවදුරටත් පහසුකම පියවීම සිදු කිරීමට අපොහොසත් වන අවස්ථාවක, යුබී ෆිනෑන්ස් විසින් සිය ගිවිසුම්ගත හිමිකම් සහ රටේ නීතියට අනුකූලව අයකිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට බලාත්කාරයෙන් යොමු කරනු ඇත. මේ සම්බන්ධයෙන් යුබී ෆිනෑන්ස් විසින් දරනු ලබන සියලුම නීතිමය සහ අනෙකුත් වියදම් ගනුදෙනුකරු විසින් දැරිය යුතුය. ගනුදෙනුකරුවන්ට යුබී ෆිනෑන්ස් හී එවැනි කටයුතුවලදී නීතිය යටතේ සහය ලබාගත හැක.

## පැමිණිලි සහ සහය

| යුබී ෆිනෑන්ස් වෙත පැමිණිල්ලක් ගොනු කිරීම | ඉදිරිපත් කිරීමේ විකල්ප |
|---|---|
| **පාරිභෝගික සේවා ඒකකය**<br>**යුබී ෆිනෑන්ස් පීඑල්සී**<br>අංක 10, ඩේසි විලා ඇවනිව්, කොළඹ 04<br>+94 011 446 8888<br>info@ubf.lk<br>www.ubf.com<br>. | **ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන්**<br>නො 01, බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය, කොළඹ 05.<br>දුර: +94 11 259 5624 \| ෆැක්ස්: +94 11 259 5625<br>fosril@sltnet.lk \| www.financialombudsman.lk<br>**මූල්‍ය පාරිභෝගික සම්බන්ධතා දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව**<br>අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01<br>ෆැක්ස්: +94 11 247 7744 \| fcrd@cbsl.lk |

ප්‍රධාන සාධක ලියවිල්ල

# ගාස්තු වගුව

වාහන ණය, උකස්කර, ඇප මත ණයදීම සහ පුද්ගල ණය සඳහා අදාළ ගාස්තු

## 1. ලියකියවිලි ගාස්තු (වාහන)

| අ) ත්‍රිරෝද /මෝටර් බයිසිකල් | රු. |
|---|---|
| රු. 150,000/- දක්වා | 5,000 |
| රු. 150,000/- සහ ඊට ඉහළ | 6,500 |

| ආ) අනෙකුත් සියලුම වාහන වර්ග සහ පහසුකම් වර්ග | රු. |
|---|---|
| රු. 150,000/- දක්වා | 7,500 |
| රු. 150,001/- සිට රු. 1,000,000/- දක්වා | 12,500 |
| රු. 1,000,001/- සිට රු. 3,000,000/- දක්වා | 16,500 |
| රු. 3,000,001/- සිට රු. 5,000,000/- දක්වා | 22,500 |
| රු. 5,000,001/- සිට රු. 7,500,000/- දක්වා | 32,500 |
| රු. 7,500,001/- සිට රු. 10,000,000/- දක්වා | 37,500 |
| රු. 10,000,001/- සහ ඊට ඉහළ | 42,500 |
| පුද්ගල ණය සඳහා රු..1,000,000/- ට පහළ | 5,000 |

## 2. පිරිසැකසුම් ගාස්තු — ලියාපදිංචි වාහන මෝටර් රථ දෙපාර්තමේන්තුවේ මාරු කිරීම

| වාහන වර්ගය | රු. |
|---|---|
| ත්‍රිරෝද /මෝටර් බයිසිකල් | 3,000 |
| අනෙකුත් සියලුම වාහන | 3,500 |

## 3. ලියකියවිලි ගාස්තු (උකස් ණය /විකිණීමේ ගිවිසුම)

| ගාස්තු වර්ගය | රු. |
|---|---|
| ලියකියවිලි ගාස්තුව | ණය මුදල × 2% |

**සටහන:** ණය මුදලෙන් 2%. උපරිම සීමාව රු. 250,000/--

## 4. ලියකියවිලි ගාස්තු (ස්ථාවර තැන්පතු වලට එරෙහි ණය)

| ගාස්තු වර්ගය | රු. |
|---|---|
| ලියකියවිලි ගාස්තුව | **1,000** |

## 5. පිරිසැකසුම් ගාස්තු — කෙටියට් සම්පූර්ණ කිරීම

| ගාස්තු වර්ගය | රු. |
|---|---|
| මෙහෙයුම් ගාස්තු | **5,000** |